දිවි තොර කරගැනීම් යනු සමාජ ගැටළුවක් ලෙසින් හඳුනා ගත හැකි හෙයින්, ඒ සම්බන්ධයෙන් වාර්තා කිරීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, දිවි තොර කරගැනීම් පිළිබඳ ප්‍රවේසම් විරහිත පුවත් වාර්තාවන් නිසා දිවි තොර කරගැනීම් වසංගතයන් ලෙසින් පැතිර යෑමටද හැකියාවක් ඇති නිසා, එම පුවත් වාර්තාවන් මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූලව ඉදිරිපත් කිරීමද එලෙසින්ම අත්‍යාවශ්‍ය වේ. විශේෂයෙන්ම බොහෝ දෙනෙකු වසංගත තත්වය නිසා ආතතියකින් පෙළෙන මේ කාලය තුළද එවැනි ප්‍රවේසමක් අත්‍යාවශ්‍ය වේ.

උදාහරණ ලෙසින් දක්වන්නේ නම්, දිවි තොර කරගැනීම් සම්බන්ධ පුවත් වාර්තාවන් තුළ දිවි තොර කරගත් ආකාරය සඳහන් නොකිරීම වඩාත් යෝග්‍ය වේ. මන්දයත්, ඇතැම් විටක එම ක්‍රමය අනුකරණය කරමින් දිවි තොර කරගැනීමට තවත් අයෙකු පෙළඹවීමට එය සමත් වන බැවිනි.

එසේම උපකාරක අංක මෙවැනි පුවත් වාර්තාවන් හා සඳහන් කිරීම ඔස්සේ, දිවි තොර කරගැනීමේ නැඹුරුතාවක් ඇති තවත් අයෙකුගේ ජීවිතය බේරාගැනීමට අවස්ථාවක් ලැබෙනු ඇත.

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

**#MediaEthicsSL #lka #sinhalanews #SundayLankadeepa #SundayDivaina**